# සවිස්තරාත්මක තත්ත්ව වාර්තා සාරාංශය

(දිනය - 2025.11.29 වේලාව - 1800)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

**2025.11.16 දින 0600 පැය සිට 2025.11.29 දින 1800 පැය දක්වා සමස්ථ තත්ත්ව වාර්තාව**

| අ.අ | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ.කො. සංඛ්‍යාව | ආපදාව | බලපෑමට ලක්වූ පවුල් | බලපෑමට ලක්වූ පුද්ගලයින් | මිය යෑම් | අතුරුදහන් | ආරක්ෂිත ස්ථාන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | පුත්තලම | 16 | | 36,098 | 135,922 | - | 2 | 59 | 3,007 | 11,221 |
| 2 | බදුල්ල | 15 | | 6,222 | 24,635 | 52 | 42 | 127 | 3,902 | 16,137 |
| 3 | මොණරාගල | 09 | | 886 | 3,105 | 3 | 1 | 6 | 156 | 442 |
| 4 | මාතලේ | 11 | | 325 | 1,800 | 12 | 4 | 12 | 286 | 919 |
| 5 | කොළඹ | 13 | | 25,159 | 99,668 | - | - | 61 | 1,217 | 6,016 |
| 6 | මඩකලපුව | 14 | | 16,257 | 47,856 | - | - | 17 | 1,315 | 3,529 |
| 7 | කෑගල්ල | 10 | | 2,148 | 8,311 | 9 | 24 | 17 | 234 | 955 |
| 8 | ත්‍රිකුණාමලය | 05 | | 10,214 | 31,634 | - | - | 14 | 612 | 1,825 |
| 9 | අනුරාධපුර | 21 | | 3,968 | 11,746 | 1 | - | 54 | 1,321 | 3,978 |
| 10 | මුලතිව් | 03 | ගංවතුර / ක්ෂණික ගංවතුර /තද වැසි/ තද සුළං/ අකුණු සැර/ නාය යෑම්/ පස්කණ්ඩි කඩා වැටීම/ ගල් පෙරලීම/ ගස් කඩා වැටීම | 670 | 782 | - | - | 22 | 1,103 | 3,508 |
| 11 | කිලිනොච්චි | 02 | | 2,862 | 8,713 | - | - | 23 | 601 | 1,713 |
| 12 | අම්පාර | 18 | | 6,445 | 21,164 | 8 | - | 12 | 649 | 1,486 |
| 13 | යාපනය | 10 | | 2,397 | 7,513 | 1 | - | 12 | 130 | 390 |
| 14 | පොලොන්නරුව | 03 | | 4,218 | 14,943 | - | - | - | - | - |
| 15 | නුවර | 19 | | 7,988 | 25,290 | 52 | 105 | 76 | 2,335 | 9,525 |
| 16 | රත්නපුර | 15 | | 1,867 | 7,764 | - | - | 5 | 105 | 454 |
| 17 | කුරුණෑගල | 28 | | 6,804 | 23,247 | 7 | 9 | 52 | 971 | 4,582 |
| 18 | නුවරඑළිය | 09 | | 250 | 920 | 6 | 4 | 49 | 380 | 1,603 |
| 19 | මාතර | 12 | | 20 | 66 | - | - | - | - | - |
| 20 | හම්බන්තොට | 08 | | 2,311 | 8,370 | 1 | - | 5 | 11 | 31 |
| 21 | ගාල්ල | 20 | | 550 | 1,733 | 1 | - | - | - | - |
| 22 | කළුතර | 10 | | 725 | 2,786 | - | - | 5 | 82 | 444 |
| 23 | මන්නාරම | 02 | | 24,313 | 79,946 | - | - | 61 | 3,795 | 11,873 |
| 24 | ගම්පහ | 08 | | 51,701 | 197,144 | - | - | 76 | 4,661 | 18,251 |
| 25 | වවුනියාව | 04 | | 2,865 | 9,666 | - | - | 33 | 621 | 2,016 |
| එකතුව | | 285 | | 217,263 | 774,724 | 153 | 191 | 798 | 27,494 | 100,898 |

| සමස්ථ ආපදා විස්තරය **Island-wide Total Incidents Summary** | සංඛ්‍යාව |
|---|---|
| • බලපෑමට ලක් වූ දිස්ත්‍රික් සංඛ්‍යාව | 25 |
| • බලපෑමට ලක් වූ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 285 |
| • බලපෑමට ලක් වූ මුළු පවුල් සංඛ්‍යාව | 217,263 |
| • බලපෑමට ලක් වූ මුළු පුද්ගල සංඛ්‍යාව | 774,724 |
| • මියයෑම | 153 |
| • අතුරුදහන් | 191 |
| • සුරක්ෂිත මධ්‍යස්ථාන සංඛ්‍යාව | 798 |
| • සුරක්ෂිත මධ්‍යස්ථානයන්හි සිටින මුළු පවුල් සංඛ්‍යාව | 27,494 |
| • සුරක්ෂිත මධ්‍යස්ථානයන්හි සිටින මුළු පුද්ගල සංඛ්‍යාව | 100,898 |

- මෙම වාර්ථාව දිස්ත්‍රික් ඒකකයන් වෙතින් දැනට ලැබී ඇති තොරතුරු මත සකස් කරන ලද්දකි. මේ වන විටත් නව තොරතුරු සහ ලැබී ඇති තොරතුරු යාවත්කාලීන වෙමින් පවතී.

**මරණ පිළිබඳ විස්තර (2025.11.26 දින සිට 2025.11.29 දින 1800 පැය දක්වා)**

| අනු අ.කය | දිස්ත්‍රික්කය | ආපදාව | මරණ ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | බදුල්ල | නාය යෑම්<br>පස්කඳු කඩා වැටීම්<br>ගංවතුර<br>ජලගැලීම්<br>දියේ ගිලීම් | 52 |
| 02 | මොණරාගල | | 3 |
| 03 | මාතලේ | | 12 |
| 04 | කෑගල්ල | | 9 |
| 05 | අනුරාධපුර | | 1 |
| 06 | අම්පාර | | 8 |
| 07 | යාපනය | | 1 |
| 08 | මහනුවර | | 52 |
| 09 | කුරුණෑගල | | 7 |
| 10 | නුවරඑළිය | | 6 |
| 11 | හම්බන්තොට | | 1 |
| 12 | ගාල්ල | | 1 |
| එකතුව | | | 153 |

## සුරක්ෂිත මධ්‍යස්ථාන පිළිබඳ විස්තර (2025.11.29 දින 1800 පැය දක්වා)

| අනු අං. | දිස්ත්‍රික්කය | සුරක්ෂිත මධ්‍යස්ථාන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | පුත්තලම දිස්ත්‍රික් එකතුව (11) | 59 | 3007 | 11221 |
| 02 | බදුල්ල දිස්ත්‍රික් එකතුව (44) | 127 | 3902 | 16137 |
| 03 | මොණරාගල දිස්ත්‍රික් එකතුව (08) | 6 | 156 | 442 |
| 04 | මාතලේ දිස්ත්‍රික් එකතුව (06) | 12 | 286 | 919 |
| 05 | කොළඹ දිස්ත්‍රික් එකතුව (05) | 61 | 1217 | 6016 |
| 06 | මඩකලපුව දිස්ත්‍රික් එකතුව (12) | 17 | 1315 | 3529 |
| 07 | කෑගල්ල දිස්ත්‍රික් එකතුව (10) | 17 | 234 | 955 |
| 08 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් එකතුව (04) | 14 | 612 | 1825 |
| 09 | අනුරාධපුර දිස්ත්‍රික් එකතුව (26) | 54 | 1321 | 3978 |
| 10 | කිලිනොච්චි දිස්ත්‍රික් එකතුව (01) | 23 | 601 | 1713 |
| 11 | අම්පාර දිස්ත්‍රික් එකතුව (11) | 12 | 649 | 1486 |
| 12 | යාපනය දිස්ත්‍රික් එකතුව (01) | 12 | 130 | 390 |
| 13 | නුවර දිස්ත්‍රික් එකතුව (07) | 76 | 2335 | 9525 |
| 14 | රත්නපුර දිස්ත්‍රික් එකතුව (06) | 5 | 105 | 454 |
| 15 | කුරුණෑගල දිස්ත්‍රික් එකතුව (30) | 52 | 971 | 4582 |
| 16 | නුවරඑළිය දිස්ත්‍රික් එකතුව (49) | 49 | 380 | 1603 |
| 17 | හම්බන්තොට දිස්ත්‍රික් එකතුව (07) | 5 | 11 | 31 |
| 18 | කළුතර දිස්ත්‍රික් එකතුව (03) | 5 | 82 | 444 |
| 19 | මන්නාරම දිස්ත්‍රික් එකතුව | 61 | 3795 | 11873 |
| 20 | ගම්පහ දිස්ත්‍රික් එකතුව (07) | 76 | 4661 | 18251 |
| 21 | වවුනියා දිස්ත්‍රික් එකතුව (18) | 33 | 621 | 2016 |
| | මුළු එකතුව | 798 | 27,494 | 100,898 |

## 2025.11.29 දින 0600 පැය සිට 2025.11.29 දින 1800 පැය දක්වා විශේෂ සිදුවීම්

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

1. කලා ඔය අසල බස් රථයේ සිරවී සිටි පුද්ගලයින් සියළුම දෙනා නාවික හමුදා නිලධාරීන්ගේ සහයෝගයෙන් සම්පූර්ණයෙන් මුදවා ගෙන ඇත.

2. මල්වතු ඔය දහයියගම මං සංදියේ ගංවතුරට හසුවී සිටි පුද්ගලයින් 03 දෙනෙකු ගුවන් හමුදාවට අයත් බෙල් 212 හෙලියානයක් යොදා ගනිමින් නිරුපද්‍රිතව මුදවා ගන්නා ලදී.

3. රාජාංගනය - ගිරිබාව ප්‍රදේශයේ ගංවතුරට හසුව සිටි පුද්ගලයින් 33 දෙනෙකු ගුවන් හමුදාවට අයත් MI 17 හෙලියානයක් මඟින් නිරුපද්‍රිතව මුදාගෙන අනුරාධපුර ගුවන් හමුදා කඳවුරට රැගෙන යන ලදී.

**පුත්තලම දිස්ත්‍රික්කය**

1. කරුවලගස්වැව, වනාතවිල්ලුව, නවගත්තේගම, පල්ලම, ආරච්චිකට්ටුව, හලාවත, වෙන්නප්පුව, මාදම්පේ, හා දන්කොටුව ප්‍රා.ලේ. කොටුවී සිටින පුද්ගලයින් මුදවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
2. හලාවත මූලික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින ගර්භනී කාන්තාවක් සහ ළමුන් දෙදෙනෙක් හදිසි ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහල වෙත රැගෙන ඒමට කටයුතු සිදු කරමින් පවතී.

2. හලාවත, ලුණුවිල, දැදුරුඔය පාලම අසල මිල්කෝ කරුමාන්ත ශාලාව ආසන්නයේ මගීන් 60ක ප්‍රමාණයක් බස් රථය තුළ සිරවී ඇති අතර එම මගීන් මුදවා ගැනීම සඳහා ත්‍රිවිධ හමුදා සහාය ලබා දීමට අවශ්‍ය කටයුතු කරමින් බවතී.

**මන්නාරම දිස්ත්‍රික්කය**

1. මාන්තෙයි ප්‍රා.ලේ. කෝරායි වැව් බැම්ම කඩාගෙන යාමෙන් පෙරියමඩු ග්‍රාමයේ පුද්ගලයින් 150 දෙනෙකුට අධික පිරිසක් කොටු වී සිටින අතර ඔවුන් මුදවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
2. පුදුකුඩිඉරුප්පු ප්‍රා.ලේ.ඉරුක්කාලම් වීදි වල පවුල් 04ක පුද්ගලයින් යටවී ඇති බව වාර්තා විය. ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

**මාතලේ දිස්ත්‍රික්කය**

1. මහවෙල පොලිස් වසමේ නිවසක් මතට පස් කණ්ඩියක් කඩා වැටී පුද්ගලයින් 03කු රෝහල් ගත කර ඇති අතර, මහවෙල පොලිස් ස්ථානයේ සහභාගිත්වයෙන් අතුරුදන් වී ඇති පුද්ගලයින් 04 දෙනා සෙවීමේ කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.

**කෑගල්ල දිස්ත්‍රික්කය**

1. අරණායක ප්‍රා. ලේ. අම්බලන්කන්ද ග්‍රාම සේවා වසමේ නාය යෑමෙන් සිරවී සිටි පුද්ගලයන් මුදවා ගැනීමට ගුවන් හමුදා හෙලියානා සහාය ලබා දුන් අතර අයහපත් කාළගුණය හේතුවෙන් නැවතත් හෙලියානා කටුනායක ගුවන් හමුදා කඳවුරට ගොඩ බස්සවා ඇත.

**කිලිනොච්චි දිස්ත්‍රික්කය**

1. ඉරණමඩු වැවේ වාන් ඇලේ වම් ඉවුර කැඩී ගොස් ඇති අතර යුධ හමුදා කණ්ඩායම් විසින් වැලි කොට්ට ගසා මෙය පාලනය කිරීමට තැත් කලද වැව් ඉවුර කැඩී ගොස් පහළ ජීවත්වූ පවුල් 100කට ආසන්න ප්‍රමාණයක් ඉවත් කර ඇති බව කිලිනොච්චි සහකාර අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

**ගම්පහ දිස්ත්‍රික්කය**

1. මිනුවන්ගොඩ, නුවර පාර, 18 කණුව, නයිකන්ද ප්‍රදේශය ජලයෙන් යටවීම හේතුවෙන් ගමනාගමනයට බාධා සිදුවී ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලදී.

**මාතලේ දිස්ත්‍රික්කය**

1. රත්තොට ප්‍රා.ලේ. නාගල වත්ත හා කෝපිමලේ ග්‍රාම සේවා වසමේ නායයෑමක් හේතුවෙන් පවුල් 90ක් පමණ පුද්ගලයින් අවදානමට ලක් වී ඇත.

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

3. පන්නල ප්‍රදේශයට බලපෑ ගංවතුර තත්ත්වය හේතුවෙන්, නාලවලාන ප්‍රදේශයේ පිහිටි වැඩිහිටි නිවාසයක සිටි කාන්තාවන් 11 දෙනෙකු මිය ගොස් ඇති අතර සෙසු අය ආරක්ෂිතව මුදාගෙන ඇත.

2025.12.01 දින ප.ව 12.30 දක්වා වලංගුවේ.
Valid till 12.30 PM on 01st of December 2025

**Time :- 12.30 PM**
**වේලාව :- ප.ව. 12.30**

ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : අංක - 08 | වර්ණය - රතු
**Flood Warning Message : Number - 08** | Colour – Red

## අධි ගංවතුර අනතුරු ඇඟවීම - Critical Flood Warning
## මහවැලි ගඟ ද්‍රෝණිය පහළ නිම්නය - Lower Catchment of Mahaweli River Basin

**මහවැලි ගඟෙහි ධාරා ප්‍රදේශවලට ලැබුණු අධික වර්ෂාපතනය සහ මහවැලි ගඟෙහි වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කරනු ලබන මනම්පිටිය ජලමාපකයේ අගයන් සලකා බැලීමේදී මහවැලි ගඟ ද්‍රෝණියේ පහළ නිම්නයේ දිඹුලාගල, තමන්කඩුව, වැලිකන්ද, ලංකාපුර, මැදිරිගිරිය, සේරුවිල, කන්තලේ, කින්නියා සහ මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් මහවැලි ගඟ ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශවල මහ ගංවතුර තත්ත්වය අධි ගංවතුර තත්ත්වයක් දක්වා ඉහල යනු ඇත. එම නිසා එම ප්‍රදේශවල මහවැලි ගඟට ආසන්නව පදිංචි මහජනතාව ඒ සම්බන්ධව ඉතා දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවන අධි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. <u>ගංඟාව දෙපස පහත් බිම්වල වෙසෙන ජනයා හැකි ඉක්මනින් ඉන් ඉවත්වීම වඩාත් සුදුසු වේ.</u> මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

දැදුරු ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.29 දින 1230 පැයට (2025.12.01 දින 1230 පැය දක්වා)

**Time :- 12.30 PM**
**වේලාව :- ප.ව.12.30**

2025.12.01 දින ප.ව 12.30 දක්වා වලංගුවේ.
Valid till 12.30 PM on 01st of December 2025

ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : අංක - 06 | වර්ණය - රතු
**Flood Warning Message : Number - 06** | Colour – Red

## දැදුරු ඔය ද්‍රෝණිය - Deduru Oya Basin

මගේ අංක DI/Hydro/103(V) හා 2025.11.27 දින ප.ව.12.30 ට දැදුරු ඔය ද්‍රෝණිය සඳහා නිකුත් කල ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක 05 න් සඳහන් කළ අනතුරු ඇඟවීම ඉදිරි පැය 48 සඳහා ද දීර්ඝ කරනු ලැබේ. **එබැවින් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

**මහ ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.29 දින 0830 පැයට (2025.12.01 දින 0830 පැය දක්වා)**

2025.12.01 දින පෙ.ව 8.30 දක්වා වලංගුවේ.
Valid till 8.30 AM on 01st of December 2025

**Time :- 8.30 AM**
**වේලාව :- පෙ.ව. 8.30**

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 04 | වර්ණය - රතු |
| **Flood Warning Message :** | **Number - 04** | Colour – Red |

## අධි අවදානම් ගංවතුර අනතුරු ඇඟවීම - Critical Flood Warning
## මහ ඔය ද්‍රෝණිය - Maha Oya Basin

මහ ඔය ද්‍රෝණියේ ඉහළ ධාරා ප්‍රදේශවල බොහෝ ස්ථානවලට පසුගිය පැය 24 තුළද අධික වර්ෂාපතනයක් ලැබී පවතී. එම වර්ෂා තත්ත්වය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් මහ ඔය ද්‍රෝණිය තුළ නඩත්තු කරනු ලබන ගංගා ජල මාපක වල ජල මට්ටම් විශ්ලේෂණය අනුව මේ මොහොතේ සිට ඉදිරි පැය 24 ක කාලය තුළ මහ ඔය **නිම්නයේ පහත්බිම් ප්‍රදේශවලට මෑත ඉතිහාසයේ ඇති නොවුණු මට්ටමේ අධි අවදානම් ගංවතුර තත්ත්වයක්** ඇතිවිය හැකි බවට අනතුරු අඟවනු ලැබේ. මේ තත්ත්වයෙන් ජීවිත ආරක්ෂා කර ගැනීම පිණිස දැඩි සැලකිල්ලෙන් කටයුතු කරන ලෙසත්, ඔබට හැකි උපරිම ආරක්ෂිත ස්ථානයක් කරා හැකි ඉක්මනින් ළඟාවන ලෙසත් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් කොට සලකා අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ඉල්ලා සිටිනු ලැබේ.

**අත්තනගලු ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.28 දින 1500 පැයට (2025.11.30 දින 1500 පැය දක්වා)**

2025.11.30 දින ප.ව 3.00 දක්වා වලංගුවේ.
Valid till 3.00 PM on 30th of November 2025

**Time :- 3.00 PM**
**වේලාව :- ප.ව. 3.00**

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 05 | වර්ණය - රතු |
| **Flood Warning Message :** | **Number - 05** | Colour – Red |

### ගම්පහ නගරය සඳහා විශේෂ ගංවතුර අනතුරු ඇඟවීම
### අත්තනගලු ඔය ද්‍රෝණිය - Aththanagalu Oya Basin

අත්තනගලු ඔය ද්‍රෝණියේ ධාරා ප්‍රදේශවල බොහෝ ස්ථානවලට මේ වනවිට අධික වර්ෂාපතනයක් ලැබෙමින් පවතී. එම වර්ෂා තත්ත්වය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් අත්තනගලු ඔය ද්‍රෝණිය තුළ නඩත්තු කරනු ලබන ගංගා ජල මාපකවල ජල මට්ටම් විශ්ලේෂණය අනුව ඉදිරි පැය 6 ක කාලය තුළ ගම්පහ නගරය හා ඒ අවට අත්තනගලු ඔය සහ උරුවල් ඔය නිම්නවල පහත්බිම් ප්‍රදේශවලට මහ ගංවතුර තත්ත්වයක් ඇතිවිය හැකි බවට අනතුරු අඟවනු ලැබේ. මේ තත්ත්වයෙන් ජීවිත හා දේපළ ආරක්ෂා කර ගැනීම පිණිස දැඩි සැලකිල්ලෙන් කටයුතු කරන ලෙස එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් සහ මෙන්ම නගරයේ වෙළඳසැල් හිමිකරුවන්ගෙන්ද ඉල්ලා සිටිනු ලැබේ. ඔවුන්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ඉල්ලා සිටිනු ලැබේ.

## මුරුදෙනි ඇරු ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.28 දින 1230 පැයට (2025.11.30 දින 1230 පැය දක්වා)

| | | | |
|---|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 02 | වර්ණය - ඇම්බර් | |
| **Flood Warning Message :** | **Number - 02** | Colour – Amber | |

### මුන්දෙනි ආරු ද්‍රෝණිය - Mundeni Aru Basin

මගේ අංක DI/Hydro/103(V) හා 2025.11.26 දින පෙ.ව.10.00 ට මුන්දෙනි ආරු ද්‍රෝණිය සඳහා නිකුත් කල ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක 01 න් සඳහන් කළ අනතුරු ඇඟවීම ඉදිරි පැය 48 සඳහා ද දීර්ඝ කරනු ලැබේ. **එබැවින් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

## ගල් ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.28 දින 1230 පැයට (2025.11.30 දින 1230 පැය දක්වා)

**Time :- 12.30 PM**
**වේලාව :- ප.ව.12.30**

2025.11.30 දින ප.ව 12.30 දක්වා වලංගුවේ.
Valid till 12.30 PM on 30th of November 2025

| | | | |
|---|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 02 | වර්ණය - රතු | |
| **Flood Warning Message :** | **Number - 02** | Colour – Red | |

### ගල් ඔය ද්‍රෝණිය - Gal Oya Basin

මගේ අංක DI/Hydro/103(V) හා 2025.11.26 දින පෙ.ව.11.45 ට ගල් ඔය ද්‍රෝණිය සඳහා නිකුත් කල ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක 01 න් සඳහන් කළ අනතුරු ඇඟවීම ඉදිරි පැය 48 සඳහා ද දීර්ඝ කරනු ලැබේ. **එබැවින් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

## යාන් ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.28 දින 0330 පැයට (2025.11.30 දින 0330 පැය දක්වා)

Time :- 3.30 AM
වේලාව :- පෙ.ව. 3.30

2025.11.30 දින පෙ.ව.3.30 දක්වා වලංගුවේ.
Valid till 3.30 AM on 30th of November 2025

| | | | |
|---|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 02 | වර්ණය - රතු | |
| **Flood Warning Message :** | **Number - 02** | Colour – Reed | |

### යාන් ඔය ද්‍රෝණිය - Yan Oya Basin

යාන් ඔය ද්‍රෝණියේ ඉහළ සහ මධ්‍යම ධාරා ප්‍රදේශවලට අධික වර්ෂාපතනයක් ලැබෙමින් නිසා සහ යාන් ඔය පිටවාන මගින් මේ වන විට ජලය පිට කරමින් පවතින බැවින් ද යාන් ඔය පහල ප්‍රදේශවලට මහ ගංවතුර තත්ත්වයක් ඇතිවිය හැකි බවට මින් අනතුරු අඟවනු ලැබේ. මෙම ගංවතුර තත්ත්වය හේතුවෙන් සිදුවිය හැකි අනතුරු අවම කරගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස යාන් ඔය පහල ප්‍රදේශවල වෙසෙන මහජනතාවගෙන් සහ ප්‍රදේශ හරහා ගමන් ගන්නා රියදුරන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. විශේෂයෙන් **කුච්චවෙලි, පදවි ශ්‍රී පුර, පදවිය, කැබිතිගොල්ලෑව, ගෝමරන්කඩවල, හොරොව්පතාන, මොරවැව, කහටගස්දිගිලිය** හා **ගලෙන්බිඳුණුවැව** යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල යාන්ඔය ආශ්‍රිත පහත් බිම්වල වෙසෙන ජනතාව සහ එම ප්‍රදේශ හරහා ගමන් කරන රථ වාහන රියදුරන් සහ මගීන් දැඩි විමසිල්ලෙන් පසුවිය යුතුය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ඉල්ලා සිටිනු ලැබේ.

**මුරුදෙනි ඇරු ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.28 දින 1230 පැයට (2025.11.30 දින 1230 පැය දක්වා)**

**Time :- 12.30 PM**
**වේලාව :- ප.ව.12.30**

2025.11.30 දින ප.ව 12.30 දක්වා වලංගුවේ.
Valid till 12.30 PM on 30th of November 2025

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 02 | වර්ණය - ඇම්බර් |
| **Flood Warning Message :** | **Number - 02** | Colour – Amber |

## <u>මුන්දෙනි ආරු ද්‍රෝණිය - **Mundeni Aru Basin**</u>

මගේ අංක DI/Hydro/103(V) හා 2025.11.26 දින පෙ.ව.10.00 ට මුන්දෙනි ආරු ද්‍රෝණිය සඳහා නිකුත් කල ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක 01 න් සඳහන් කළ අනතුරු ඇඟවීම ඉදිරි පැය 48 සඳහා ද දීර්ඝ කරනු ලැබේ. **එබැවින් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

**කැළණි ගඟ ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.28 දින 1300 පැයට (2025.11.30 දින 1300 පැය දක්වා)**

2025.11.30 දින ප.ව 1.00 දක්වා වලංගුවේ.
Valid till 1.00 PM on 30th of November 2025

**Time :- 1.00 PM**
**වේලාව :- ප.ව. 1.00**

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 03 | වර්ණය - රතු |
| **Flood Warning Message :** | **Number - 03** | Colour – Red |

## <u>අධි අවදානම් ගංවතුර අනතුරු ඇඟවීම - **Critical Flood Warning**</u>

## <u>කැළණි ගංගා ද්‍රෝණිය - **Kelani River Basin**</u>

කැළණි ගංගා ද්‍රෝණියේ ධාරා ප්‍රදේශවල බොහෝ ස්ථානවලට මේ වනවිට අධික වර්ෂාපතනයක් ලැබෙමින් පවතී. එම වර්ෂා තත්ත්වය ද, කැළණි ගඟ ඉහළ ද්‍රෝණියේ පිහිටි ජලාශවලින් පිටකරනු ලබන ජල ප්‍රමාණ සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් කැළණි ගංගා ද්‍රෝණිය තුළ නඩත්තු කරනු ලබන ගංගා ජල මාපක වල ජල මට්ටම් විශ්ලේෂණය අනුව මේ මොහොතේ සිට ඉදිරි පැය 24 ක කාලය තුළ කැළණි ගංගා නිම්නයේ පහත්බිම් ප්‍රදේශවලට මෑත ඉතිහාසයේ ඇති නොවුණු මට්ටමේ අධි අවදානම් ගංවතුර තත්ත්වයක් ඇතිවිය හැකි බවට අනතුරු අඟවනු ලැබේ. මේ තත්ත්වයෙන් ජීවිත ආරක්ෂා කර ගැනීම පිණිස දැඩි සැලකිල්ලෙන් කටයුතු කරන ලෙසත්, ඔබට හැකි උපරිම ආරක්ෂිත ස්ථානයක් කරා හැකි ඉක්මනින් ළඟාවන ලෙසත් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් කොට සලකා අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ඉල්ලා සිටිනු ලැබේ.

**මී ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.28 දින 1230 පැයට (2025.11.30 දින 1230 පැය දක්වා)**

**Time :- 12.30 PM**
**වේලාව :- ප.ව.12.30**

2025.11.30 දින ප.ව 12.30 දක්වා වලංගුවේ.
Valid till 12.30 PM on 30th of November 2025

**ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : අංක - 02**
**Flood Warning Message : Number - 02**

වර්ණය - ඇම්බර්
Colour – Amber

## මී ඔය ද්‍රෝණිය - Mee Oya Basin

මගේ අංක DI/Hydro/103(V) හා 2025.11.27 දින පෙ.ව.11.30 ට මී ඔය ද්‍රෝණිය සඳහා නිකුත් කල ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක 01 න් සඳහන් කළ අනතුරු ඇඟවීම ඉදිරි පැය 48 සඳහා ද දීර්ඝ කරනු ලැබේ. **එබැවින් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

**කළු ගඟ ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.28 දින 0100 පැයට (2025.11.30 දින 0100 පැය දක්වා)**

**Time :- 1.00 A.M**
වේලාව :- පෙ.ව **1.00**

2025.11.30 දින පෙ.ව 1.00 දක්වා වලංගුවේ.
Valid till 1.00 AM on 2025.11.30

ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : අංක **01**
**Flood Warning Message : Number 01**


වර්ණය - ඇම්බර්
Colour – Amber

## කළු ගඟ ද්‍රෝණිය - Kalu River Basin

අද දින අලුයම 1.00 වන විට කළු ගඟ ද්‍රෝණියේ ධාරා ප්‍රදේශවලට සැළකියයුතු වර්ෂාපතනයක් ලැබී ඇති අතර තවදුරටත් වර්ෂාව ලැබෙමින් පවතී. එම වර්ෂා තත්ත්වය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් කළු ගඟ ද්‍රෝණිය තුළ නඩත්තු කරනු ලබන ගංගා ජල මාපකවල ජල මට්ටම් විශ්ලේෂණය අනුව මෙතැන් සිට ඉදිරි පැය **48**ක කාලය තුළ **රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල, නිවිතිගල, රත්නපුර, කුරුවිට, අයගම, ඇලපාත සහ කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය, හොරණ, දොඩන්ගොඩ, මිල්ලනිය** යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල කළු ගඟ පිටාර තැන්නට අයත් පහත් බිම් ප්‍රදේශවලට සුළු **ගංවතුර තත්ත්වයක්** ඇතිවිය හැකි බවට අනතුරු අඟවනු ලැබේ. මේ තත්ත්වය සම්බන්ධයෙන් දැඩි සැලකිල්ලකින් කටයුතු කරන ලෙස එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් සහ ප්‍රදේශ හරහා ගමන් ගන්නා වාහන පදවන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ඉල්ලා සිටිනු ලැබේ.

**දිට්වා සුළි කුණාටුව පිළිබඳ නිවේදනය 2025.11.29 දින 1400 පැයට**

"දිට්වා" [Ditwah] සුළිකුණාටුව යාපනය සිට 80 km ක් නැගෙනහිර දෙසින්, අක්ෂාංශ 9.6°N සහ දේශාංශ 80.7°E ආසන්නයේ කේන්ද්‍රගතව වී ඇත. මෙම පද්ධතිය උතුරට බරව වයඹ දෙසට ගමන් කරනු ඇත. (සුළිකුණාටුවේ ගමන් මාර්ගය පහතින් දක්වා ඇත.)



## 2025.11.29 දින 1530 පැයට ප්‍රධාන ගංගා ආශ්‍රිත ජල මට්ටම්

**DATE :** 29-Nov-2025 **TIME :** 3:30 PM

| River Basin | Tributory/River | Gauging Station | | | | | Water Level at 2:00 pm | Water Level at 3:00 pm | Remarks | Water Level Rising or Falling | 6 Hr RF in mm at 3.00 pm |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Station | Unit | Alert Level | Minor Flood Level | Major Flood Level | | | | | |
| Kelani Ganga (RB 01) | Kelani Ganga | Nagalagam Street | ft | 4.00 | 5.00 | 7.00 | 6.20 | 6.20 | Minor Flood | | - |
| | Kelani Ganga | Hanwella | m | 7.00 | 8.00 | 10.00 | 10.78 | 10.81 | Major Flood | Rising | 0.0 |
| | Kelani Ganga | Glencourse | m | 15.00 | 16.50 | 19.00 | 20.86 | 20.75 | Major Flood | Falling | 0.0 |
| | Kelani Ganga | Kithulgala | m | 3.00 | 4.00 | 6.00 | 3.00 | 2.85 | Normal | | 2.0 |
| | Gurugoda Oya | Holombuwa | m | 3.00 | 3.40 | 5.00 | 2.90 | 2.81 | Normal | | 0.3 |
| | Seethawaka Ganga | Deraniyagala | m | 4.80 | 5.80 | 6.40 | 2.42 | 2.38 | Normal | | 0.7 |
| | Kehelgamu Oya | Norwood | m | 1.50 | 3.00 | 4.50 | 1.72 | 1.70 | Alert | Falling | 0.0 |
| Kalu Ganga (RB 03) | Kalu Ganga | Putupaula | m | 3.00 | 4.00 | 5.00 | 3.87 | 3.87 | Alert | | 0.0 |
| | Kalu Ganga | Ellagawa | m | 10.00 | 10.70 | 12.20 | NA | NA | | | - |
| | Kalu Ganga | Rathnapura | m | 5.20 | 7.50 | 9.50 | 8.62 | 8.55 | Minor Flood | Falling | 1.2 |
| | Maguru Ganga | Magura | m | 4.00 | 6.00 | 7.50 | 4.56 | 4.53 | Alert | Falling | 0.0 |
| | Kuda Ganga | Kalawellawa (Millakanda) | m | 5.00 | 6.50 | 8.00 | 8.13 | 8.13 | Major Flood | | 0.6 |
| Gin Ganga (RB 09) | Gin Ganga | Baddegama | m | 3.50 | 4.00 | 5.00 | 3.22 | 3.20 | Normal | | 0.0 |
| | Gin Ganga | Thawalama | m | 4.00 | 6.00 | 7.50 | 2.56 | 2.54 | Normal | | 0.0 |
| Nilwala Ganga (RB 12) | Nilwala Ganga | Thalgahagoda | m | 1.40 | 1.70 | 2.80 | 1.61 | 1.61 | Alert | | 0.0 |
| | Nilwala Ganga | Panadugama | m | 5.00 | 6.00 | 7.50 | 4.49 | 4.46 | Normal | | 0.0 |
| | Nilwala Ganga | Pitabeddara | m | 4.00 | 5.00 | 6.50 | 1.51 | 1.49 | Normal | | 0.0 |
| | Urubokka Ganga | Urawa | m | 2.50 | 4.00 | 6.00 | 0.98 | 0.97 | Normal | | 0.0 |
| Walawe Ganga (RB 18) | Walawe Ganga | Moraketiya | m | 3.00 | 5.00 | 7.00 | 2.29 | 2.25 | Normal | | 0.0 |
| Kirindi Oya (RB 22) | Kirindi Oya | Thanamalwila | m | 4.00 | 5.00 | 5.50 | 2.10 | 2.10 | Normal | | 0.0 |
| | Kirindi Oya | Wellawaya | m | 4.40 | 5.40 | 5.90 | 1.38 | 1.37 | Normal | | 0.0 |
| | Kuda Oya | Kuda Oya | m | 6.90 | 8.40 | 8.80 | 2.41 | 2.39 | Normal | | 0.0 |
| Menik Ganga (RB 26) | Menik Ganga | Katharagama | m | 4.00 | 4.60 | 6.50 | 3.13 | 2.90 | Normal | | 0.0 |
| Kumbukkan Oya (RB 31) | Kumbukkan Oya | Nakkala | m | 5.00 | 6.00 | 7.50 | 2.05 | 2.00 | Normal | | 0.0 |
| Heda Oya (RB 36) | Heda Oya | Siyambalanduwa | m | 4.50 | 6.00 | 7.00 | 1.62 | 1.62 | Normal | | 0.0 |
| Maduru Oya (RB 54) | Maduru Oya | Padiyathalawa | m | 4.00 | 4.50 | 6.00 | NA | NA | | | - |
| Mahaweli Ganga (RB 60) | Mahaweli Ganga | Manampitiya | m | 3.00 | 4.30 | 6.00 | NA | NA | | | - |
| | Mahaweli Ganga | Weraganthota | m | 5.00 | 6.00 | 8.00 | NA | NA | | | - |
| | Mahaweli Ganga | Peradeniya | m | 5.00 | 7.00 | 9.00 | NA | NA | | | - |
| | Mahaweli Ganga | Nawalapitiya | m | 3.50 | 5.00 | 6.00 | NA | NA | | | - |
| | Badulu Oya | Thaldena | m | 3.00 | 4.00 | 5.00 | NA | NA | | | - |
| Yan Oya (RB 67) | Yan Oya | Horowpothana | m | 6.00 | 7.50 | 10.50 | 7.73 | 7.72 | Minor Flood | Falling | 2.8 |
| Maa Oya (RB 69) | Mukunu Oya | Yaka Wewa | m | 4.00 | 5.00 | 6.00 | NA | NA | | | - |
| Malwathu Oya (RB 90) | Malwathu Oya | Thanthirimale | m | 5.00 | 6.80 | 7.80 | NA | NA | | | - |
| Mee Oya (RB 95) | Mee Oya | Galgamuwa | m | 4.84 | 5.94 | 8.00 | NA | NA | | | - |
| Deduru Oya (RB 99) | Deduru Oya | Moragaswewa | m | 4.75 | 6.00 | 7.00 | NA | NA | | | - |
| Maha Oya (RB 102) | Maha Oya | Badalgama | m | 5.00 | 6.20 | 9.60 | 13.39 | 13.38 | Major Flood | Falling | 0.5 |
| | Maha Oya | Giriulla | m | 5.50 | 6.50 | 7.50 | 11.76 | 11.47 | Major Flood | Falling | 0.0 |
| Attanagalu Oya (RB 103) | Attanagalu Oya | Dunamale | m | 3.30 | 4.40 | 5.50 | 6.70 | 6.60 | Major Flood | Falling | 0.5 |

**නායයෑම් පිළිබඳ අවවාදත්මක නිවේදනය 2025.11.29 දින 1630 පැයට (2025.11.30 දින 1630 පැය දක්වා )**

| දිස්ත්‍රික්කය | විමසිලිමත් මට්ටම (කහ) | අවදානම් මට්ටම (ඇම්බර්) | ඉවත්වීම (රතු) |
|---|---|---|---|
| බදුල්ල | | | මීගහකිවුල, හාලි ඇල, වැලිමඩ, ඌව පරණගම, කන්දකැටිය, ලුණුගල, බණ්ඩාරවෙල, සොරණතොට, පස්සර, බදුල්ල, ඇල්ල, හල්දුම්මුල්ල, හපුතලේ |
| කොළඹ | හෝමාගම, කැස්බෑව, කඩුවෙල, මහරගම | | පාදුක්ක, සීතාවක |
| ගාල්ල | | තවලම, නෙළුව | |
| ගම්පහ | මීරිගම, දොම්පේ, බියගම | | අත්තනගල්ල |
| හම්බන්තොට | ඕකේවෙල, වලස්මුල්ල, තංගල්ල, බෙලිඅත්ත, වීරකැටිය | | |
| කළුතර | | වලල්ලාවිට, මතුගම, අගලවත්ත, පාලින්දනුවර | හොරණ, බුලත්සිංහල, ඉංගිරිය |
| මහනුවර | | | උඩුදුම්බර, මිනිපේ, දොළුව, මැදදුම්බර, පාතහේවාහැට, ගඟඉහල කොරලේ, උඩපලාත, දෙල්තොට, ගඟවටකෝරලේ, අකුරණ, උඩුනුවර, යටිනුවර, පාතදුම්බර, තුම්පනේ, පස්බාගේකොරලේ, පන්විල, හාරිස්පත්තුව, පූජාපිටිය, කුණ්ඩසාලේ, හතරලිද්ද |
| කෑගල්ල | | | රඹුක්කන, අරණායක, මාවනැල්ල, බුලත්කොහුපිටිය, කෑගල්ල, වරකාපොල, ගලිගමුව, රුවන්වැල්ල, යටියන්තොට, දැරනියගල, දෙහිඕවිට |
| කුරුණෑගල | | | මල්ලවපිටිය, මාවතගම, රිදීගම, නාරම්මල, අලව්ව, පොල්ගහවෙල |
| මොණරාගල | | බඩල්කුඹුර, වැල්ලවාය | බිබිල, මැදගම |
| මාතලේ | | | යටවත්ත, විල්ගමුව, අඹන්ගඟ කෝරලේ, උකුවෙල, රත්තොට, නාඋල, පල්ලෙපොල, ලග්ගල පල්ලේගම, මාතලේ, උකුවෙල |
| මාතර | පස්ගොඩ, හක්මන, මුලටියන, කඩවත් සතර, පිටබැද්දර, කොටපොල, කිරින්ද පුහුල්වැල්ල, දික්වැල්ල, දෙවිනුවර, තිහගොඩ, වැලිපිටිය, අතුරලිය, අකුරැස්ස, වැලිගම, මාලිම්බඩ | | |
| නුවරඑළිය | | | වලපනේ, හඟුරන්කෙත, නිල්දණ්ඩාහින්න, මතුරට නුවරඑළිය, කොත්මලේ නැගෙනහිර, කොත්මලේ බටහිර, තලවකැලේ, අඹගමුව, නෝර්වුඩ් |
| රත්නපුර | | වැලිගෙපොල, කොටපොල, ඇඹිලිපිටිය | **කිරිඇල්ල, ඇහැලියගොඩ, කුරුවිට, රත්නපුර, පැල්මඩුල්ල, ගොඩකවෙල, ඕපනායක,** ඇලපාත, ඉඹුල්පෙ, කලවාන, කොලොන්න, කහවත්ත , බලංගොඩ |

*(මූලාශ්‍ර - NBRO)*

## ප්‍රධාන ජලාශ ආශ්‍රිත වාන් දොරටු විවෘත කිරීම ( 2025.11.29 දින 1800 පැයට )

| අනු අංකය | දිස්ත්‍රික්කය | ජලාශය | විවෘත කර ඇති වාන් දොරටු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | රාජාංගනය | වාන්දොරටු 16 අඩි 07 බැගින් විවෘතකර ඇත.<br>වාන්දොරටු 10 අඩි 05 බැගින් විවෘතකර ඇත. |
| 02 | | අංගමුව | වාන්දොරටු 02 අඩි 06 බැගින් විවෘතකර ඇත. |
| 03 | | කලාවැව | වාන්දොරටු 02 අඩි 15 බැගින් විවෘතකර ඇත. |
| 04 | කුරුණෑගල | දැදුරු ඔය | වාන්දොරටු 08 අඩි 19 බැගින් ද විවෘතකර ඇත. |
| 05 | මහනුවර | පොල්ගොල්ල | වාන්දොරටු 03 අඩි 02 අඟල් 06 බැගින් විවෘතකර ඇත. |
| 06 | මොණරාගල | වෙහෙරගල | වාන්දොරටු 02 අඩි 01 බැගින්ද<br>වාන්දොරටු 04 අඟල් 06 බැගින් ද විවෘතකර ඇත. |
| 07 | මාතලේ | බෝවතැන්න | වාන්දොරටු 06 අඩි 03 බැගින් විවෘතකර ඇත. |
| 08 | මහනුවර | රන්ටැඹේ | වාන්දොරටු 02 මීටර් 2 ½ බැගින් විවෘතකර ඇත. |
| 09 | බදුල්ල | උල්හිටිය - රත්කිඳ | වාන්දොරටු 07 අඩි 01 බැගින් විවෘතකර ඇත. |
| 10 | කළුතර | කුකුලේගඟ | වාන්දොරටු 02 තත්.ඝන මීටර් 64 බැගින් විවෘතකර ඇත. |
| 11 | හම්බන්තොට | ලුණුගම්වෙහෙර | වාන්දොරටු 06 අඩි 01 අඟල් 04 බැගින් විවෘතකර ඇත. |

*(මූලාශ්‍ර - අදාළ වාරි ඉංජිනේරු කාර්යාල)*

- **වැදගත් - ඉහත සඳහන් ජලාශ හා වැව් වලට අමතරව දිවයිනේ ප්‍රධාන ජලාශ හා වැව් රැසක වාන් දොරටු විවෘත කර තිබේ.**

## 2025.11.29 දින 1800 පැයට මාර්ග ජලයෙන් යටවී ඇති ස්ථාන

- අම්පාර දිස්ත්‍රික්කය
  - අලයඩිවෙම්බු ප්‍රා.ලේ. කොට්ඨාශයේ අක්කරෙයි පත්තු - කන්ජන්කුඩා ප්‍රධාන මාර්ගය සහම කෝසුව අසලින් අඩි 2 ½ පමණ යටවී ඇත. මාර්ගය වසා ඇත.
  - සමන්තුරේ ප්‍රා.ලේ. කොට්ඨාශයේ අම්පාර - කරෙයිතිව් ප්‍රධාන මාර්ගය වලතපිඩ්ඩි යන ස්ථානයේ අඩි 02 ක් පමණ ජලයෙන් යටවී ඇත.
  - අම්පාර ප්‍රා.ලේ. කොට්ඨාශයේ අම්පාර - ඉඟිනියාගල ප්‍රධාන මාර්ගය කොන්ඩුවෙඩ්ඩුවාන් කෝසුව අසලින් අඩි 1 ½ පමණ ජලයෙන් යටවී ඇත.
  - කරයිතිව් ප්‍රා.ලේ. කොට්ඨාශයේ කල්මුණේ - අම්පාර ප්‍රධාන මාර්ගය මාවඩිපිල්ලි කෝසුව අසලින් අඩි 02 පමණ ජලයෙන් යටවී ඇත.
  - නවිතන්වේලි ප්‍රා.ලේ. කොට්ඨාශයේ කිඩන්ගි පාලම අසලින් අඩි 03 ක් පමණ ජලයෙන් යටවී ඇත. මාර්ගය වසා ඇත.
  - පොතුවිල් ප්‍රා.ලේ. කොට්ඨාශයේ පොතුවිල් - ලාහුගල ප්‍රධාන මාර්ගයේ 02 වන සැතපුම් කණුව අසල අඩි 1 ½ පමණ ජලයෙන් යටවී ඇත.

- මොණරාගල දිස්ත්‍රික්කය
  - සියඹලාණ්ඩුව ප්‍රා.ලේ.කො. කෝන්ගස්පිටිය ග්‍රා.නි. වසමේ සුගලාදේවි වැවේ පිටවාන වන කෝසුව හා පුස්කිවුල කෝසුව ජලයෙන් යටවී ගමනාගමනයට බාධා සිදුව ඇත.
  - මඩුල්ල ප්‍රා.ලේ.කොට්ඨාශයේ මාරි අරාව ග්‍රා.නි. වසමේ යමින් ආර සහ ගංගොඩආර පිටාර ගැලීමෙන් ගමනාගමනයට බාධා සිදුව ඇත.

- අනුරාධපුර දිස්ත්‍රික්කය
  - කැකිරාව ප්‍රා.ලේ. කොට්ඨාශයේ කැකිරාව - හඳුන්ගම හරහා ගල්නෑව මාර්ගය අඩි 02 1/2 ක් ජලයෙන් යටවී ගමනාගමනයට බාධා සිදුව ඇත.
  - කැකිරාව ප්‍රා.ලේ. කොට්ඨාශයේ අවුකන හරහා කලාවැව මාර්ගය අඩි 02ක් ජලයෙන් යට වී ගමනාගමන බාධා සිදුවිය ඇත.
  - පදවිය ප්‍රා.ලේ. කොට්ඨාශයේ බුද්ධංගල ග්‍රා.නි. වසමේ වැළි ඇල සපත්තු පාලම හා වව්නියා පරාක්‍රමපුර මා ඔය සපත්තු පාලම හරහා අඩි 03ක් පමණ ජලයෙන් යටවී ඇත.
  - රාජාංගනය පාදේශීය ලේකම් කාර්යලය ඉදිරිපිට ප්‍රධාන මාර්ගය කැඩී ගොස් ඇත. ගමනගමනය කල නොහැක.

- ❖ පොළොන්නරුව දිස්ත්‍රික්කය
  - ➢ සෝමවති විහාරස්ථානයට ගමන්ගන්නා මාර්ගයේ කොටසක් අඩි 01ක පමණ ජල මට්ටමක් පවතින අතර, පවතින අධික වර්ෂාවත් සමඟ ජලමට්ටම ඉහලයා හැකි බැවින් ප.ව 5.00න් පසු නැවත දැනුම්දෙන තුරු සියළු වාහන ගමන්කිරීම තාවකාලිකව නතර බව දැනුම් දී ඇත.
  - ➢ පොළොන්නරුව මඩකලපුව ප්‍රධාන මාර්ගය (ගල් ලෑල්ලේ සිට මනම්පිටිය දක්වා ) පෙ.ව 2.45 සිට සියළුම වාහන සඳහා නතර කර ඇත.

- ❖ මාතර දිස්ත්‍රික්කය
  - ➢ මුලටියන ප්‍රා.ලේ. කොට්ඨාශයේ මාකඳුර නගරයේ පාලම අසල මාර්ගය ජලයෙන් යටවී ඇති අතර විකල්ප මාර්ග ලෙස මාකඳුර - මූලනවත්ත මාර්ගය භාවිතා කෙරේ.

- ❖ වව්නියා දිස්ත්‍රික්කය
  - ➢ A9 මාර්ගයේ නොච්චිමුටේ සිට ශාන්තිමේලා දක්වා මාර්ගය වසා ඇත.

- ❖ පුත්තලම දිස්ත්‍රික්කය
  - ➢ පුත්තලම - කොළඹ මාර්ගයේ වෙන්නප්පුව සිට පුත්තලම දක්වා මාර්ගය වසා ඇත.

- ❖ ගම්පහ දිස්ත්‍රික්කය
  - ➢ කොළඹ - කුරුණෑගල අංක 5 මාර්ගය කොටදෙණියාව ප්‍රදේශයෙන් ජලයෙන් යටවීම නිසා වාහන ගමනාගමනය නතරවී ඇත.
- ❖ බදුල්ල දිස්ත්‍රික්කය
  - ➢ මහියංගනය මාර්ගයේ 8 කණුව ප්‍රදේශයේ පාලම කැඩී ඇති බැවින් මාර්ගය අවහිර වී ඇත.
  - ➢ පස්සර බදුල්ල මාර්ගය නායයෑම් හේතුවෙන් අවහිර වී ඇත.
  - ➢ මඩොල්සිම - මැටිගහතැන්න මාර්ගය
- ❖ කුරුණෑගල දිස්ත්‍රික්කය
  - ➢ පාදෙනිය අනුරාධපුර මාර්ගයේ මිනුවන්ගැටේ, ඇල්ල ප්‍රදේශය ජලයෙන් යට වී ඇත.
  - ➢ කුරුණෑගල පුත්තලම මාර්ගයේ විතිකුලිය හංදිය සිට දැදුරු ඔය පාලම දක්වා මාර්ගය වසා ඇත.

**අවසන් පැය 24 තුල මී.මී. 150 ඉක්මවූ වර්ෂාපතන දත්ත ( 2025.11.29 දින 1800 පැයට )**

| ස්ථානය | දිස්ත්‍රික්කය | වර්ෂාපතනය (මි.මි) |
|---|---|---|
| කයිකාවාලා | මහනුවර | 408.8 |
| පුස්සැල්ලාව | මහනුවර | 275.8 |
| මැණික්දිවෙල | මහනුවර | 266.2 |
| කැන්දගොල්ල | බදුල්ල | 253.8 |
| ශුද්ධ වූ ත්‍රිත්වය | මහනුවර | 253.6 |
| පොත්පිටිය | මහනුවර | 246.6 |
| හාලිඇල | බදුල්ල | 213.8 |
| පොට්කර්නී | මන්නාරම | 204 |
| රාගල ලිඩිස්ඩේට් | නුවරඑළිය | 199 |
| මහරච්චිමුල්ල | කුරුණෑගල | 196.2 |
| හෙට්ටිපොල | මාතලේ | 192 |
| මීගහකිවුල | බදුල්ල | 190.4 |
| තෙරිපේ | නුවරඑළිය | 188.2 |
| නිල්දණ්ඩහින්න | නුවරඑළිය | 182.6 |
| වියළුව | බදුල්ල | 180.4 |
| යාල්කුඹුර | මොනරාගල | 172 |
| උඩුව | මහනුවර | 169.6 |
| කඩුගන්නාව | මහනුවර | 168.2 |
| ඉඹුල්පිටිය | කෑගල්ල | 164.2 |
| වල්පොලකන්ද | කුරුණෑගල | 157 |
| මධුරගොඩ | කුරුණෑගල | 152.2 |
| දඹදෙණිය | කුරුණෑගල | 151 |
| රාගල | නුවරඑළිය | 150.4 |

(මූලාශ්‍ර - NBRO Met)

**2025.11.29 දින 1800 පැයට බෝට්ටු හා හට පිරිස් ස්ථානගත කිරීම්**

| දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කාර්යාලය | යොදවා ඇති ස්ථානය | ස්ථානගත කිරිම |
|---|---|---|---|
| ගාල්ල | තවලම | අශෝකාරාමය - තවලම | නාවික හමුදාවේ 01 X 10 හට පිරිසක් සහ OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | නාගොඩ | නාගොඩ ප්‍රා.ලේ. කාර්යාලය | නාවික හමුදාවේ 01 X 05 හට පිරිසක් සහ OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | | විද්‍යාතිලක පිරිවෙන - නාගොඩ | නාවික හමුදාවේ 01 X 05 හට පිරිසක් සහ OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | නෙළුව | සුදර්ශනාරාමය - නෙළුව | යුද්ධ හමුදාවේ 01 X 16 හට පිරිසක් සමඟ OBM 01, ඩිංගි 01 ක් ස්ථානගත කර ඇත. |
| මාතර | අතුරලිය | පානදුගම | යුද්ධ හමුදාවේ (3 ගැජේබ) 01 x 05 හට පිරිසක් යුනි බෆල් රථ 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | කඹුරුපිටිය | කඹුරුපිටිය පොලිසිය | යුද්ධ හමුදාවේ (9 ශ්‍රීලංසිරෙ) 01x 05 හට පිරිසක් යුනි බෆල් රථ 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| රත්නපුර | රත්නපුර | නව නගරය - රත්නපුර | නව නගරයේ නාවික හමුදාවේ 03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| කෑගල්ල | වරකපොළ | වරකපොළ | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| අනුරාධපුරය | අනුරාධපුරය | අනුරාධපුරය | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | ඉපලෝගම | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | තඹුත්තේගම | තඹුත්තේගම පොලිසිය | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | ගල්නෑව | ගල්නෑව පොලිසිය | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | සෙට්ටිකුලම | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | මැදවච්චිය | මැදවච්චිය නගරය | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| පුත්තලම | රස්නායකපුර | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | පරණ එළුවන්කුලම | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | පල්ලම | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | ආරච්චිකට්ටුව | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | ආනමඩුව | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | පුත්තලම | පුත්තලම නගරය | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | වාරියපොළ | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | කරුවලගස්වැව | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| මහනුවර | මහනුවර | මහනුවර නගරය | ගුවන් හමුදා සෙබළු 02කු බෝට්ටු 01 සමඟ 2SR කඳවුරේ ස්ථාගනගත කර ඇත. |

කේ.ඒ.ඩී.පී.කේ.කොඩිප්පිලි
අධ්‍යක්ෂ (පුහුණු හා දැනුවත් කිරීම්) රා.ඉ. / රාජකාරි භාර නිළධාරී
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය